වසර 8 කට පෙර සිදු කරන ලද මනුෂ්‍ය ඝාතනයක් සම්බන්ධයෙන් පුද්ගලයෙකුට සැප්තැම්බර් 13 වන දින හම්බන්තොට මහාධිකරණය මඟින් මරණ දඬුවම නියම කිරීමේ පුවත, මාධ්‍ය අවධානයට ලක්ව තිබිණි.

පුවත් වාර්තාවන්ගෙන් දැක්වෙන ආකාරයට, චූදිත පුද්ගලයා විසින්, ඔහුගේ මව හා සම්බන්ධතාවයක් පැවැත්වූ බවට පැවසෙන වින්දිත පුද්ගලයා සමඟ ඇති කරගත් ආරවුලක ප්‍රතිඵලයක් ලෙසින් මෙම ඝාතනය සිදුවී තිබේ.

එසේම, "තම මවගේ වැරදි හැසිරීම් නිසා මරණ දණ්ඩනය හිමිවී ඇති" බව පවසමින් විත්තිකරු අධිකරණයේදී හඬා වැටුණු බවද වැඩිදුරටත් එම පුවත් වාර්තාවන් තුළ සඳහන් කර තිබිණි.

එම දිනමිණ, දිවයින, අරුණ සහ ලංකාදීප පුවත් වාර්තාවන්හි සිරස්තල දැක්වී තිබුණේ පහත සඳහන් ආකාරයන්ගෙනි.

ඔබ සිතන ලෙසට, මෙම සිරස්තල හැඟීම් කළඹවන සුළු (භාවාතිශය) ආකාරයකින් දැක්වීම අවශ්‍ය ද? ඒ ඔස්සේ, මෙම ඝාතනය සාධාරණීකරණය කිරීමක් සිදු නොවන්නේ ද?

